1523

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ද්විතීයික හා තෘතියික අධ්‍යාපන අධ්‍යනාංශය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 2021/2022
අවසාන පරීක්ෂණය - 2023
**SNP8208/STP8311/ESP2111 - අන්තර්කරණ අධ්‍යාපනය**
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.11.25 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

I වන කොටසේ <u>සියලුම</u> ප්‍රශ්න වලටද II වන කොටසේ ඕනෑම ප්‍රශ්න <u>තුනකටද (03)</u> පිළිතුරු සපයන්න.

## <u>I වන කොටස</u>

01. විශේෂ අධ්‍යාපනය සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා යන යෙදුම් ඔබේ වචනවලින් වෙන්කර දක්වන්න.

02. අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ සංකල්පය උදාහරණ සහිතව ඔබගේ වචනවලින් විස්තර කරන්න.

03 රෝග පාලනය සහ වැළැක්වීම සහ ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, දෘෂ්‍ය තීව්‍රතාවය සහ ඌණතාව වර්ගීකරණය කෙටියෙන්පැහැදිලි කරන්න.

04. සුවිශේෂී ඉගෙනුම් දුබලතාව නිර්වචනය කරන්න.

05. විෂයමාලා අනුවර්තනය කිරීමේ ක්‍රම දෙක (02) පැහැදිලි කරන්න.

06. ඔබේම උදාහරණ සමඟ ඉගෙනුම විවිධාංගීකරණය යන්නෙහි තේරුම කෙටියෙන් පැහැදිලි කරන්න.

07. අන්තර්කරණ පන්ති කාමරයක ස්ථාන ඉගැන්වීමේ ක්‍රමය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

08. අන්තර්කරණ පන්ති කාමරයක සේවය කරන ගුරුවරුන්ගේ ප්‍රධාන භූමිකාවන් පහක් (05) සඳහන් කර ඉන් එකක් උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. අ) 'අන්තර්කරණය තුළ ඇත්තේ වෙන්කර හා වෙනස්කොට සැලකීමකින් තොරව සැමට සාධාරණ සහ සමානාත්මතාවය හරහා පාලනය වන පරමාදර්ශ සහ මූලධර්ම ය.'

වෙන්කර හා වෙනස්කොට සැලකීමකින් තොරව සැමට සමාන අවස්ථා සහතික කිරීම සඳහා මූලධර්ම හය **(06)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ අන්තර්කරණ අධ්‍යාපනයේ සන්දිස්ථාන උදාහරණ ගෙනහැර දක්වමින් විමසන්න. (ලකුණු 07)

ඇ) ශ්‍රී ලංකාවේ විවිධත්වයෙන් යුතු දරුවන් සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමුන් සඳහා සමාන අධ්‍යාපනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට ඇති බාධක විස්තර කරන්න. (ලකුණු 07)

10. අ) මිනිස් කනෙහි ශ්‍රවණ ක්‍රියාවලිය විස්තර කරන්න. (ලකුණු 06)

ආ) ඇසීමේ අඩුවක් නිරාවරණය කර ගත හැකි ආකාර තුනක් **(03)** උදාහරණ සහිත ව දක්වන්න. (ලකුණු 06)

ඇ) ප්‍රබල ශ්‍රවණාබාධ අනාවරණයන් සහිත සිසුන් සඳහා අන්තර්කරණ පන්ති කාමරයක ඉඩ සැලසීමට ගත හැකි උපාය මාර්ග දක්වන්න. (ලකුණු 08)

11. අ) "සියලුම හොඳ ගුරුවරුන් සිසුන්ගේ සාර්ථකත්වය සඳහා විෂයමාලා අනුවර්තනය අන්තර්කරණ පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරයි."

විෂයමාලා අනුවර්තනයේ ආකාර නවය **(09)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ආ) පහත සඳහන් පද පැහැදිලි කර ඒවා අතර ඇති වෙනස්කම් කෙටියෙන් විමසා බලන්න.

- විෂයමාලා ඉඩ සැලසීම
- විෂයමාලා සංශෝධනය (ලකුණු 08)

ඇ) ශ්‍රී ලංකාවේ රජයේ පාසලක අන්තර්කරණ පන්තිකාමර ගුරුවරයෙකු ලෙස, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විෂයමාලා අනුවර්තනය සම්බන්ධයෙන් ගුරුවරයෙකු මුහුණ දෙන අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. අ) 'සහයෝගී ඉගැන්වීම' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

ආ) ගුරුවරයෙකු වශයෙන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ විශේෂ අධ්‍යාපන ඒකක සහිත සාමාන්‍ය පාසල්වල සහයෝගී ඉගැන්වීම් ක්‍රම ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද? (ලකුණු 07)

ඇ) "ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ ජයග්‍රහණ වැඩි දියුණු කිරීමට ඇති ප්‍රධාන බාධාව වන්නේ පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාව නොමැති කමයි."

නිසි සාක්ෂි සපයා ඉහත ප්‍රකාශය විමර්ශනය කරන්න. (ලකුණු 08)

13. අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ වර්තමාන අන්තර්කරණ භාවිතයන් උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 06 )

ආ) අන්තර්කරණ පන්තිකාමර ගුරුවරුන් එලදායී අන්තර්කරණ පන්තිකාමර ගුරුවරයෙකු ලෙස තම භූමිකාව ඉටු කිරීමේ දී මුහුණ දෙන අභියෝග මොනවා ද? (ලකුණු 07)

ඇ) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල අන්තර්කරණ පන්තිකාමර ගුරුවරුන්ගේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 07)

14. අ) ක්‍රියාකාරී තක්සේරුව සහ සායනික තක්සේරුව යනු කුමක්දැයි උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 03)

ආ) "දුබලතා සහිත ළමුන්ගේ ක්‍රියාකාරී තක්සේරුව සිදු කිරීමට අන්තර්කරණ පන්තිකාමර ගුරුවරයෙකුට හැකි විය යුතුය."

ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 05)

ඇ) "විශේෂ පාසල්, විශේෂ අධ්‍යාපන ඒකක සහ අන්තර්කරණ අධ්‍යාපනය තවමත් ශ්‍රී ලංකාව තුළ තවමත් භාවිත වේ."

ඉහත සඳහන් පද්ධති තුනෙහි ප්‍රායෝගික වැදගත්කම උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.